දුරකථන:
**தொலைபேசி**
Telephone:
සභාපති
**தலைவர்**
Chairman: (+94) 011 2556840
ලේකම්
**செயலாளர்**:
Secretary: (+94) 011 2556831
කාර්යාලය
**காரியாலயம்**
Office: (+94) 011 2556834
011 3071324
ෆැක්ස්:
**தொ.நகல்**
Fax (+94) 011 2556836
011 2556837
විද්‍යුත් තැපැල
**மின்னஞ்சல்**:
e-mail fincom@sltnet.lk

# මුදල් කොමිෂන සභාව
( ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154'ජ' ව්‍යවස්ථාව යටතේපිහිටුවන ලදී.)

# நிதிஆணைக்குழு
**(அரசியலமைப்பின் 154`எ ஆம்உறுப்புரையின்கீழ் தாபிக்கப்பட்டது)**

**FINANCE COMMISSION**
**(Established under Article 154 R of the Constitution)**

48, වජිර පාර,
කොළඹ 04.
48,**வஜிரா வீதி**,
**கொழும்பு**-04,**இலங்கை**.
48,Vajira Road,
Colombo 04, Sri Lanka.

මගේ අංක
**எனது இல**:
My No FC/3/2/2016
ඔබේ අංක
**உமது இல**:
Your No
දිනය
**திகதி**:
Date 26.11.2015

ප්‍රධාන ලේකම්

දකුණු පළාත

හිතවත් ප්‍රධාන ලේකම්තුමනි,

**<u>වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාල මාර්ගෝපදේශ - 2016</u>**

පළාත් මගින් ඉටුකරනු ලබන සංවර්ධන කාර්යයන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලද රජය, 2016 වර්ෂය සඳහා ඒකාබද්ධ අරමුදලෙන් ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරන ප්‍රතිපාදන මීට පෙර වර්ෂ හා සසඳන විට දෙගුණයක් ඉක්මවන පරිදි ලබාදීමට තීරණය කර ඇත.රජය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් ගනු ලැබූ එම තීරණයට අනුව, 2016 වර්ෂයට පළාත් සඳහා වෙන් කරනු ලබන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානවලින් 53% ක් පමණ අධ්‍යාපන හා සෞඛ්‍යය යන අංශවලට වෙන් කිරීමට ද පියවර ගෙන ඇත.

මෙම අරමුදල් රජය විසින් එකතු කරන ලද ආදායමට අමතරව විවිධ මූලාශ්‍ර වෙතින් ලබාගත් ණය හා ප්‍රදානවලින් සමන්විත වන බැවින්, එම අරමුදල් අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීම සඳහා ඉතා ප්‍රශස්ත අයුරින් උපයෝජනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2016 වර්ෂය සඳහා ඔබ පළාතට වෙන් කර ඇති විදේශ සහායක ව්‍යාපෘති ද ඇතුළත් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන මාගේ අංක FC/6/1/2016 හා 2015.11.21 දිනැති ලිපියෙන් ඔබ වෙත එවා ඇත.

රජයේ සංවර්ධන උපායමාර්ග තුළින් අපේක්ෂිත අරමුණු අතුරින් ජාතික හා ජාත්‍යන්තර අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි වන පරිදි 2020 වන විට මානව සම්පත් සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒම ප්‍රධාන තැනක් ගනී. ඒ සමග මධ්‍යම ආදායම් කාණ්ඩයේ රටක් ලෙස දැනට ලබාගෙන ඇති ප්‍රගතිය තවදුරටත් ඉදිරියට වර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර, ආර්ථික වර්ධනය වේගය 7-8% ක මට්ටමක පවත්වාගෙන යාමට ඉලක්ක කර ඇත. ඒ අනුව, සමාජ-වෙළඳපොළ ආර්ථිකය පිළිබඳ සංකල්පය ඔස්සේ යමින් ඒකපුද්ගල ආදායම වැඩි කිරීමටත්, විවිධ ආදායම් කාණ්ඩ අතර පවත්නා ආදායම් ව්‍යාප්ති විෂමතා අඩු කිරීමට හා ප්‍රාදේශීය වශයෙන් දක්නට ලැබෙන සමාජ-ආර්ථික සංවර්ධන විෂමතා අවම කරලීමටත් රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ වැඩි අවධානයක් යොමු කර ඇත. මෙම අරමුණු ළඟා කරගැනීම පහසු කරවනු පිණිස පහත දැක්වෙන මූලික කරුණු කෙරෙහි රජය ප්‍රමුඛත්වය ලබාදෙනු ඇත.

i. රැකියා හා ආදායම් උත්පාදනය අරමුණු කරගෙන ස්වයං රැකියා හා සුළු පරිමාණ ව්‍යවසායක අංශය දිරිගැන්වීම.
ii. මධ්‍යම පන්තිය සවිබල ගැන්වීම හරහා ඔවුන් ආර්ථික සංවර්ධනයට දායක කරගැනීම.
iii. දුෂ්කර ගම්මාන දියුණු කිරීම මගින් සංවර්ධනයේ ප්‍රතිඵල ප්‍රාදේශීය වශයෙන් සාධාරණ අයුරින් බෙදීයාමට ඉඩප්‍රස්ථා සැලසීම.
iv. ගෙවත්ත, ගම හා පළාත් කේන්ද්‍ර කරගනිමින් ජාතික මට්ටමෙන් ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් දේශීය ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
v. සෞඛ්‍ය හා අධ්‍යාපන වැනි සමාජයීය යටිතල පහසුකම් සඳහා වැඩිපුර රාජ්‍ය අරමුදල් යොමු කිරීම තුළින් රැකියා වෙළඳපොළට ගැලපෙන අයුරින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
vi. දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සානුබල පෞද්ගලික අංශයට ලබාදීම මගින් කර්මාන්ත අංශයේ දායකත්වය ඉහළ නැංවීම.
vii. පශු සම්පත් ද ඇතුළුව කෘෂිකර්ම අංශය තුළට යෝග්‍ය තාක්ෂණය හඳුන්වාදීම තුළින් සෞඛ්‍යයට හිතකර හා තිරසාර අයුරින් ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.
viii. සියලුම පොදු ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම මගින් මගී හා භාණ්ඩ ප්‍රවාහනය ඵලදායී ලෙස පවත්වාගෙන යාම.
ix. පහසුවෙන් පීඩාවට පත්විය හැකි සමාජ කණ්ඩායම් සඳහා ප්‍රමාණවත් පරිදි ආධාර සැපයීම හා ඔවුන් සවිබල ගැන්වීම.
x. පරිසර සංරක්ෂණය කේන්ද්‍ර කරගනිමින් සියලුම ස්වභාවික සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කිරීම මගින් හරිත සංවර්ධනයකට ආර්ථිකය යොමු කිරීම.
xi. විධිමත් පරිදි නීතිය හා සාමය පවත්වාගෙන යාම සහ විනයගරුක හා සදාචාරත්මක සමාජයක් බිහි කිරීමටත්, ඒ සඳහා රාජ්‍ය තන්ත්‍රය තුළ යහපාලන මූලධර්ම ස්ථාපිත කිරීමටත් කටයුතු කිරීම.

තවද, පළාත් සභා මගින් ඉටුකරන සේවාවන්ට අනුගතවන පරිදි ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමේ අරමුණින් පහත දැක්වෙන වැඩසටහන්හඳුන්වාදීමට රජය ප්‍රමුඛත්වය ලබාදෙනු ඇත.

i. ආර්ථික සංවර්ධන අධිකලාප පිහිටුවීම මගින් නිෂ්පාදන කර්මාන්ත, කෘෂිකර්මය, සංචාරක කර්මාන්තය හා සැපයුම් සේවා කේන්ද්‍රකොටගත් විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
ii. මුළු දිවයිනම ආවරණය වන පරිදි කර්මාන්ත හා තාක්ෂණ සංවර්ධන අධිකලාප ඇති කිරීම තුළින් ප්‍රාදේශීය මට්ටමෙන් නව නිෂ්පාදන කර්මාන්ත දිරිගැන්වීම.
iii. සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අරමුණින් සංචාරක සංවර්ධන අධිකලාප පිහිටුවීම.
iv. කෘෂිකාර්මික සංවර්ධන අධිකලාප පිහිටුවීම තුළින් කෘෂිකාර්මික නිෂ්පාදන ලෝක වෙළඳපොළ තුළ තරග කළ හැකි පරිදි ඉහළ නැංවීම.
v. ධීවර ආර්ථික සංවර්ධන අධිකලාප වෙරළ තීරය ආවරණය වන පරිදි පිහිටුවීම තුළින්මහා පරිමාණ හා සුළු පරිමාණ ධීවර කර්මාන්තකරුවන් දිරිගැන්වීම.
vi. දිවයින පුරා පොකුරු ගම්මාන ඇති කිරීම තුළින් ගම කේන්ද්‍රකොටගත් සංවර්ධන වැඩසටහන් වේගවත් කිරීම.

එසේම, එක්සත් ජාතීන්ගේ 70 වැනිමහ සමුළු සැසිවාරයට සමගාමීව පවත්වන ලද තිරසාර සංවර්ධන සමුළුවේදී සාමාජික රටවල් 193ක් තිරසාර සංවර්ධනය උදෙසා කටයුතු කිරීමට එකඟතාවය පළකරන ලද

අතර,2015.09.25 දින එම රටවල් තිරසාර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය අනුමත කරන ලදී. මෙම න්‍යාය පත්‍රයේ තිරසාර සංවර්ධන අරමුණු 17ක් සහ ඉලක්ක 169ක් අන්තර්ගතවේ.මෙම තිරසාර සංවර්ධන අරමුණු 17 අතුරින් පළාත් සඳහා අදාල වන අරමුණු පහත පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකි වේ.

i. සෑම ස්වරූපයකින්ම සියලු තැන්හි පවත්නා දිළිඳුකම 2030 වන විට අවසන් කිරීම සඳහා ඉලක්කගත කණ්ඩායම්වලට අවශ්‍ය මූලික සම්පත් හා සේවාවන්ට ප්‍රවේශ වීමේ ඉඩ ප්‍රස්ථා වැඩි කිරීම හා ගැටුම් හා දේශගුණික සාධක සම්බන්ධ ආපදාවන්ගෙන් පීඩාවට පත් ජනතාවට සහාය දැක්වීම.

ii. සෑම ස්වරූපයකින්ම පවතින කුසගින්න හා මන්දපෝෂණය 2030 වන විට ශුන්‍යත්වයට පත්කිරීම සඳහා සියලුම ජනතාවට, විශේෂයෙන් දරුවන් හා වඩා වැඩි අවදානමක් සහිත පුද්ගලයන්ට වර්ෂය පුරාම ප්‍රමාණවත් හා පෝෂ්‍යදායී ආහාර ලබා දීම සහතික කිරීම කළ යුතු වේ. මේ සඳහා තිරසාර කෘෂිකාර්මික භාවිතය, ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම, කුඩා පරිමාණයේ ගොවිපළවල්වල ධාරිතාවය වැඩි කිරීම, ඉඩම් සඳහා සමානව ප්‍රවේශ වීමේ හැකියාව ඇති කිරීම සහ තාක්ෂණය හා වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීම.

iii. සෑමට මනා සෞඛ්‍ය තත්ත්වයක් සහ සුභසාධනය සැලසෙන පරිදි 2030 වන විට ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියාව සහ අනෙකුත් බෝවන රෝග හා වසංගත රෝග තුරන් කිරීම උදෙසා විශ්ව සෞඛ්‍ය ආවරණයක් හා සුරක්ෂිත සහ ඵලදායී ඖෂධ හා එන්නත් ලබාගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සහතික කරලීම.

iv. ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම තහවුරු කිරීම සඳහා 2030 වන විට සියලුම දරුදැරියන් සඳහා ප්‍රාථමික සහ ද්විතියික නිදහස් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය සහතික කිරීම, වෘත්තීය පුහුණුව සඳහා සමාන අවස්ථා සැලසීම සහ ගුණාත්මක උසස් අධ්‍යාපනයක් සඳහා විශ්වීය ප්‍රවේශය සාක්ෂාත් කිරීමේ අරමුණ ඇතිව ස්ත්‍රී පුරුෂ විෂමතා හා ආදායම් විෂමතා තුරන් කිරීම.

v. පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සැලසීම සඳහා 2030 වනවිට විශ්වීය ප්‍රවේශය සහතික කිරීම පිණිස ප්‍රමාණවත් යටිතල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් සඳහා ආයෝජනය කිරීම සහ සෑම මට්ටමින්ම සනීපාරක්ෂාව තහවුරු කිරීම. එසේම, ජල හිඟය අවම කිරීම සඳහා වනාන්තර, කඳු, තෙත් බිම් හා ගංගා සම්බන්ධ පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම.

vi. සෑමට සාධාරණ මිලකට පවිත්‍ර බලශක්තිය ලබාගැනීම සඳහා වසර 2030 වන විට විදුලිය සඳහා විශ්වීය ප්‍රවේශය සහතික කිරීම පිණිස සූර්ය, සුළං හා තාප වැනි පවිත්‍ර බලශක්ති මූලාශ්‍ර සඳහා ආයෝජනය කිරීම.

vii. පුළුල් වන විෂමතාවයන් අවම කිරීමට පහළ ස්ථරවලට අයත් ආදායම් කාණ්ඩ බලගැන්වීම සඳහා සුදුසු ප්‍රතිපත්ති අනුගමනය කිරීම හා ජනවාර්ගික හා ස්ත්‍රී පුරුෂභාවය වැනි කරුණු නොසලකා ඔවුන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම සඳහා පියවර ගැනීම.

viii. 2030 වන විට වනාන්තර, තෙත් බිම්, ශුෂ්ක බිම් හා කඳු වැනි භෞමික පරිසර පද්ධතිවල භාවිතය සංරක්ෂණය කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම, දේශගුණික විපර්යාස පිළිබඳ බලපෑම හැකිතාක් අවම කිරීම සඳහා වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහ වන විනාශය නතර කිරීම.

ඉහත සඳහන් කරන ලද රජයේ සංවර්ධන ප්‍රවේශය තුළින් අපේක්ෂිත අරමුණු හා එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම පිණිස පළාත් සභා ද ස්වකීය වගකීම හා දායකත්වය ලබා දිය හැකි වන පරිදි පළාත් සැලසුම් සකස් කළ යුතු වේ.

රජයේ ප්‍රතිපාදන ඵලදායී අයුරින් ආයෝජනය කිරීම සහතික කිරීම පිණිස භාණ්ඩාගාර ලේකම්ගේ 2015.07.29 දිනැති අංක 3/2015 දරන අයවැය චක්‍රලේඛය මගින් ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශය 2016 වර්ෂයේ සිට හඳුන්වා දී ඇත. එබැවින්, 2016 වර්ෂයේ සිට සියලුම පළාත් ආයතන ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශයට අනුගත විය යුතු අතර, එක් එක් අංශ/ආයතන සඳහා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී වාර්ෂික අයවැය ප්‍රතිපාදන සමග මනා ගැලපීමක් ඇති වන පරිදි, ඒවා සකස් කළ යුතු වේ. මෙම නව ප්‍රවේශය මගින් නම්‍යශීලී මූල්‍ය කළමනාකරණ ප්‍රවේශයකට මග සලස්වනු ලබන අතර, දැනටමත් ඔබ පළාත තුළ ක්‍රියාත්මක වන ප්‍රතිඵල පාදක සැලසුම් ප්‍රවේශය සමග මෙය මැනවින් අනුගත වනු ඇත.

මාගේ අංක FC/6/1/2016 හා 2015.11.21 දිනැති ලිපිය මගින් ඔබ වෙත එවන ලද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන එක් එක් අංශ සඳහා වෙන් කිරීම් දක්වා ඇති උපලේඛනයෙහි අධ්‍යාපනය, සෞඛ්‍යය, පළාත් මාර්ග, ප්‍රවාහන, කෘෂිකර්මය, පශු සම්පත් හා සංචාරක යන ප්‍රධාන අංශ, උප වැඩසටහන් යටතේ වර්ග කර ඇත. මෙම උප වැඩසටහන් අනුව 2016 වර්ෂය සඳහා වූ රජයේ මුද්‍රිත ඇස්තමේන්තුවේ මුදල් වෙන් කිරීම් දක්වා ඇති බැවින්, මූල්‍ය ප්‍රගති වාර්තා එම වර්ගීකරණයට අනුව මහා භාණ්ඩාගාරය වෙත මාසිකව ඉදිරිපත් කළ යුතුය. එබැවින්, වාර්ෂික සංවර්ධන සැලැස්මෙහි දැක්වෙන ප්‍රමුඛ පරාස මෙම උප වැඩසටහන් සමග සුදුසු පරිදි ගලපා ගැනීම කළ යුතු අතර, සැලැස්මේ ඇතුළත් ප්‍රමුඛ පරාස සංශෝධනයට ලක් කිරීම මේ අවස්ථාවේ දී අවශ්‍ය නොවේ.

2016 වර්ෂය සඳහා පළාතට අදාලව වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී පහත දැක්වෙන පොදු කරුණු හා ආංශික ප්‍රතිපත්ති හා උපායමාර්ග කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

<u>පොදු කරුණු</u>

i. පළාත තුළ පවත්නා සමාජ-ආර්ථික විෂමතා අවම කිරීම සඳහා පළාතට අයත් දිස්ත්‍රික් අනුව සම්පත් වෙන් කිරීම වඩාත් ඵලදායී හා කාර්යක්ෂම වන බැවින්, 2016 වර්ෂයේ සිට ඉදිරියට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන වෙන් කිරීමේ දී දිස්ත්‍රික් පදනම සැලකිල්ලට ගනු ලැබේ. ඒ අනුව, 2016 වර්ෂයේ සිට පළාත් සංවර්ධන සැලැස්ම ද දිස්ත්‍රික්ක අනුව සකස් කිරීමට පළාත් බලධාරීන් විසින් පියවර ගත යුතු වේ.
ii. ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශයට අනුව සෑම මුදල් වර්ෂයක්ම නව වර්ෂයක් ලෙස සැලකිල්ලට ගනිමින් ආංශික/ආයතන මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති හඳුනාගත යුතු වේ. ඒ අනුව, අදාල වර්ෂය තුළ සැලසුම් කළ පරිදි සියලු ව්‍යාපෘති, ඉදිකිරීම් හා ක්‍රියාකාරකම් අවසන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු වේ.
iii. වාණිජ පදනමකින් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශය සහභාගි කරගත යුතු අතර, ඒ සඳහා ව්‍යාපෘතියේ ස්වරූපය මත පදනම්ව සුදුසු ක්‍රමවේද අනුගමනය කළ යුතු වේ.
iv. රාජ්‍ය වියදම් මනා ලෙස කළමනාකරණය කිරීමට පියවර ගැනීම තුළින් නාස්තිය හා දූෂණය වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. ඒ අනුව, ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීමේ දී හා

ගොඩනැගිලි ඉදිකිරීමේ දී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටි අනුගමනය කළ යුතු අතර, රජයේ ගොඩනැගිලි, වාහන, යන්ත්‍රසූත්‍ර හා උපකරණ උපරිම ප්‍රතිඵල ලැබෙන අයුරින් භාවිත කළ යුතුවේ. යෝජිත ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසු මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමුවනු ඇත.

v. පළාත තුළ ප්‍රාදේශීය වශයෙන් පවත්නා සංවර්ධන විෂමතාවයන් හැකිතාක් දුරට අවම කිරීමට හැකි වන පරිදි ව්‍යාපෘති හඳුනාගත යුතු අතර, ඒ සඳහා "ඉල්ලුම මත පදනම් වූ ප්‍රවේශය" අනුව යමින් ප්‍රජා සහභාගිත්වය ලබාගත යුතු වේ.

vi. ඉදිකිරීම් සඳහා අරමුදල් වැය කිරීමේ දී දැනට අර්ධ වශයෙන් නිම කර ඇති ගොඩනැගිලි නිම කිරීමට හා ඒවා මහජනතාවගේ ප්‍රයෝජනයට යොදා ගැනීම කෙරෙහි මූලික අවධානය යොමු කළ යුතු වේ. තවද, ගොඩනැගිලි සැලසුම් කිරීමේ දී, එක් කාර්යාල පරිශ්‍රයකින් සේවාවන් රාශියක් ලබාදිය හැකි පරිදි අදාල සැලසුම් සකස් කළ යුතු වේ. එසේම, ඌන-උපයෝජිත ගොඩනැගිලි සුදුසු පරිදි භාවිතයට යොදාගත යුතු අතර, අවශ්‍යතාවය අනුව වෙනත් සුදුසු ආයතනයකට වුව ද එය භාවිතයට ගැනීමට හැකි වන පරිදි පියවර ගත යුතුය.

vii. සෑම ව්‍යාපෘතියක් සඳහාම අරමුදල් ඉල්ලුම් කිරීමට පෙර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පෙර සූදානමට අදාල කාර්යයන් සපුරාගෙන තිබිය යුතුය.

viii. ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශය සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි වන පරිදි අදාල වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු වේ. බොහෝ පළාත් ආයතන මගින් එවැනි ප්‍රසම්පාදන සැලසුම් සකස් කර නොමැති බව විගණකාධිපති විසින් පෙන්වා දී ඇති බැවින්, මේ පිළිබඳව අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

ix. සෑම අංශයකටම අදාලව සෘජු ප්‍රදාන ලබාදීම අවම වශයෙන් 50% ක වත් ප්‍රතිලාභී දායකත්වය මත සිදු කළ යුතු වේ.

x. සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී, ජාතික හා පළාත් මට්ටමේ ආයතන සහ පළාත් පාලන ආයතනවලින් ඉටු කෙරෙන කාර්යයන් සමග ඇතිවිය හැකි ද්විකරණය වළක්වා ගත යුතුය.

<u>ආංශික කරුණු</u>

**1 සමාජ යටිතල පහසුකම්:**

**1.1 සාමාන්‍ය අධ්‍යාපනය:**

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පිළියෙල කරන ලද "අධ්‍යාපන අංශ සංවර්ධන රාමුව සහ වැඩසටහන (2012-2016)" යටතේ නිකුත් කර ඇති උපදෙස්වලට ද අනුගතවන පරිදි පළාතේ අධ්‍යාපන සැලසුම් පිළියෙල කළ යුතු අතර, පහත දැක්වෙන උප වැඩසටහන් යටතේ අරමුදල් යෙදවීම කළ යුතුය.

**1.1.1 ඉදිකිරීම් නිම නොකරන ලද පාසල් ගොඩනැගිලි සම්පූර්ණ කිරීම සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම**

- ඉදිකිරීම් නිම නොකළ සියලුම ගොඩනැගිලි ප්‍රමුඛතා පදනමක් යටතේ සම්පූර්ණයෙන් නිම කිරීමට පියවර ගත යුතු වේ.
- විශාල පරිමාණයේ අලුත්වැඩියා කටයුතු සිදුකිරීමේ අවශ්‍යතාවය පැන නැගීමට පෙර සියලුම ප්‍රාග්ධන වත්කම්වල නඩත්තු කටයුතු කාලීනව සිදු කළ යුතුය.

- දැනටමත් ලබාදී ඇති පාසල් දන්ත චිකිත්සාගාර සඳහා අවශ්‍ය මූලික ගොඩනැගිලි පහසුකම් සහ අලුත්වැඩියා කටයුතු ප්‍රමුඛතා පදනමකින් සිදු කළ යුතුය.

- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපනය ලබාදීම සඳහා දැනට තිබෙන මධ්‍යස්ථාන අලුත්වැඩියාව සහ නවීකරණය කළ යුතු අතර, එවැනි දරුවන්ගේ අවශ්‍යතා ඉටුවන පරිදි මූලික ඉදිකිරීම් සැලසුම් කළ යුතුය.

**1.1.2 ගුරු නිවාස ඇතුළු පොදු පහසුකම් සැපයීම**

- දුෂ්කර පාසල්වල ගුරු හිඟය මග හැරීමේ පියවරක් ලෙස ගුරු නිවාස ඉදිකිරීම කළ යුතු වේ.

- හඳුනාගත් දුෂ්කර මෙන්ම ඉල්ලුමක් තිබෙන පාසල්වල පවත්නා ගුරු නිවාස අලුත්වැඩියා කිරීමට ප්‍රමුඛතාවය දිය යුතුය.

- පාසල් කේන්ද්‍රකොටගත් ගුරු නිවාස පමණක් ඉදිකිරීම වෙනුවට පාසල් කිහිපයකට ආසන්න වන සේ නගරාශ්‍රිතව පොදු ගුරු නිවාස ඉදි කිරීම වඩා යෝග්‍ය වේ.

- ඉගෙනීමේ/ඉගැන්වීමේ ක්‍රියාවලිය ඵලදායී ලෙස යොදාගත හැකි වන පරිදි ගුරුවරුන් සඳහා අවශ්‍ය අනෙකුත් පොදු පහසුකම් සැපයිය යුතු වේ.

**1.1.3 ගුරු අධ්‍යාපනය උසස් තලයකට පරිවර්තනය කිරීම/ අධ්‍යාපන සේවාවන් වෘත්තීයකරණය කිරීම**

- විදුහල්පතිවරුනට අධ්‍යාපන පරිපාලනය පිළිබඳව නිසි පුහුණුවක් ලබාදිය යුතුය.

- ගුරුවරුනට නිර්මාණශීලී ඉගැන්වීමේ ක්‍රම සහ දරුවන් ඉගෙනීමට පෙළඹවීම පිළිබඳ පුහුණුවීම් ලබාදීමට ක්‍රියා කළ යුතුය.

- ගුරුවරුන්ගේ විෂයානුබද්ධ දැනුම යාවත්කාලීන කිරීම හා වැඩිදියුණු කිරීමේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

- වාර්ෂික ගුරු සම්මේලන (Teacher Conventions) පැවැත්වීමට අවශ්‍ය පියවර ගත යුතුය. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලෝක බැංකු අරමුදල්වලින් ක්‍රියාත්මක කෙරෙන TSEP ව්‍යාපෘතිය යටතේ ලබාදීමට එම ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක එකඟ වී ඇත. ගුරු සම්මේලන පැවැත්වීම පිළිබඳ විශේෂිත උපදෙස් TSEP ව්‍යාපෘතියේද එකඟතාවය මත අතිරේක මාර්ගෝපදේශයක් ලෙස නිකුත් කරනු ලැබේ.

**1.1.4 පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම**

- මෙම වැඩසටහන සඳහා රජය ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදී ඇති හෙයින්, පළාත්/කලාප/කොට්ඨාශ මට්ටමෙන් වැඩි අවධානයක් යොමු කළ යුතුය.

- සෑම පාසලකටම පිරිසිදු හා ආරක්ෂිත පානීය ජලය සැපයීමට ක්‍රියා කළ යුතුය.

- වැසිකිළි වැනි සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් පරිදි සැපයීමට ක්‍රියා කළ යුතු අතර, ඒවායෙහි පවිත්‍රතාවය සහතික කරලීම සඳහා ක්‍රියා කළ යුතුය (මෙවැනි පහසුකම් නඩත්තු කිරීම සඳහා පාසලේ විදුහල්පතිගේ නායකත්වයෙන් ගුරුවරුන් සහ ශිෂ්‍යයින් සම්බන්ධ කරගත් සහභාගිත්ව වැඩපිළිවෙලක් සකස් කිරීම).

**1.1.5 විධිමත් පාසල් අධ්‍යාපනයෙන් බැහැරවන සිසුනට වෘත්තීය අධ්‍යාපනය සඳහා මගපෙන්වීම හා පහසු කරලීම**

- මේ පිළිබඳ විශේෂිත උපදෙස් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ද එකඟතාවය මත අතිරේක මාර්ගෝපදේශයක් ලෙස නිකුත් කරනු ලැබේ.

**1.1.6 සාමාන්‍ය අධ්‍යාපනයට අදාල වෙනත් වැඩසටහන්**

- ඉහත දක්වන ලද උප වැඩසටහන් යටතේ ඇතුළත් කිරීමට නොහැකි වූ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ඉවහල් වන වෙනත් ක්‍රියාකාරකම් මේ යටතේ ඇතුළත් කළ හැකිය.

**1.2 සෞඛ්‍යය:**

සෞඛ්‍යය ක්ෂේත්‍රයේ වැඩසටහන් සැලසුම් කිරීමේ දී සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් හඳුන්වාදී ඇති ප්‍රතිපත්ති සහ උපායමාර්ගවලට අනුගත වන පරිදි පළාත් අධිකාරීන් විසින් කටයුතු කළ යුතුය.

**1.2.1 බටහිර වෛද්‍ය ක්ෂේත්‍රය:**

**1.2.1.1 ඉදිකිරීම් නිම නොකරන ලද රෝහල් ගොඩනැගිලි සම්පූර්ණ කිරීම හා ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම**

- ඉදිකිරීම් නිම නොකරන ලද සෞඛ්‍යය අංශයට අදාල සියලුම ගොඩනැගිලි ප්‍රමුඛතා පදනමක් යටතේ සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වේ.

- විශාල පරිමාණයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවය පැන නැගීමට පෙර සියලුම ප්‍රාග්ධන වත්කම්වල නඩත්තු කටයුතු කාලීනව සිදු කළ යුතුය.

**1.2.1.2 කාර්යමණ්ඩල නිල නිවාස ඇතුළු පොදු පහසුකම් සැපයීම**

- විශේෂයෙන් දුෂ්කර පළාත්වලට අයත් රෝහල්වල වෛද්‍යවරුන් ඇතුලු කාර්යමණ්ඩල අවශ්‍යතාවයන් නිසි පරිදි පවත්වා ගැනීමට හැකි වන පරිදි නිල නිවාස ඉදිකිරීම කළ යුතුය.

- රෝහල් කාර්යමණ්ඩල සඳහා අවශ්‍ය අනෙකුත් පොදු පහසුකම් සැපයිය යුතුය.

**1.2.1.3 වෛද්‍ය උපකරණ මිලට ගැනීම හා නඩත්තු කිරීම**

- නේවාසික සහ බාහිර අංශ රෝගීන්ගේ ප්‍රතිකාර ඉක්මණින් හා කාර්යක්ෂමව ලබාදීමට හැකි වන පරිදි අවශ්‍ය වෛද්‍ය උපකරණ මිලට ගැනීම මෙන්ම දැනට තිබෙන උපකරණ මැනවින් නඩත්තු කළ යුතුය.

**1.2.1.4 රෝග නිවාරණය හා පාලනය කිරීම**

- ඩෙංගු, වෛරස් උණ වැනි සීඝ්‍රයෙන් පැතිරෙන වසංගත රෝග නිවාරණය හා මර්දනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

- හෘද රෝග, දියවැඩියාව, වකුගඩු රෝග හා පිළිකා වැනි බෝනොවන රෝග සීඝ්‍රයෙන් වර්ධනය වීමේ උපනතියක් දක්නට ලැබෙන හෙයින්, ඒ පිළිබඳ අවශ්‍ය දැනුවත් කිරීම් මෙන්ම එවැනි රෝග නිවාරණය සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

- බෝ නොවන රෝග (NCD)සඳහා වන වැඩසටහන්වලට ප්‍රතිපාදන වෙන් කිරීමේ දී ජාතික මට්ටමේ ප්‍රතිපාදන හා වැඩසටහන්වලට අනුගත වන පරිදි අදාල ක්‍රියාමාර්ග ගත යුතුය.

**1.2.1.5 සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි බල ප්‍රදේශවල ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම**

- මාතෘ හා ළමා සායන කාර්යක්ෂම හා ප්‍රමාණවත් අයුරින් පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීම කළ යුතුය.

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මධ්‍යස්ථානවලට අවශ්‍ය මූලික පහසුකම් ප්‍රමුඛත්ව පදනමකින් සැපයීම හා ඒවා කාර්යක්ෂම කළ යුතුය.
- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා පවුල් සෞඛ්‍ය සේවිකාවන් වැනි ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ගේ සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

**1.2.1.6 ප්‍රාදේශීය සහ මූලික රෝහල්වල බාහිර රෝගී අංශ, හදිසි ප්‍රතිකාර ඒකක, දන්ත වෛද්‍ය ඒකක සහ අනෙකුත් සායනයන් වැඩිදියුණු කිරීම**

- පළාත් රෝහල්වලින් සැපයෙන සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග වෙනුවෙන් මෙම මුදල් වැය කළ යුතු වේ.

- මෙම සේවාවන් වැඩිදියුණු කිරීම තුළින් දිස්ත්‍රික් හා ශික්ෂණ රෝහල්වලට පැමිණෙන රෝගීන් සංඛ්‍යාව අවම කරගැනීමට ක්‍රියා කළ යුතුය.

**1.2.1.7 බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයට අදාල අනෙකුත් වැඩසටහන්**

- බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයට අදාලව ඉහතින් දක්වන ලද උප වැඩසටහන් යටතේ ඇතුළත් නොකරන ලද ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් මේ යටතේ ඇතුළත් කළ යුතුය.

**1.2.2 දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය (ආයුර්වේද, සිද්ධ සහ යුනානි ඇතුළත්):**

**1.2.2.1 සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමවේදය සංරක්ෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම**

- ලේඛනගත කර නොමැති සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම මතු පරපුර සඳහා ආරක්ෂා කිරීම පිණිස නූතන තාක්ෂණය භාවිතා කරමින් සංරක්ෂණය කිරීම සිදු කළ යුතුය.

- ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන සම්ප්‍රදායික වෛද්‍යවරුන්ගේ සේවය සමාජයට ඵලදායී ලෙස ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතුය.

**1.2.2.2 ඔසු උයන් සහ ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය කිරීම**

- ප්‍රාදේශීය වශයෙන් ඖෂධ වර්ග නිෂ්පාදනය පහසුකරලීමට හැකි වන පරිදි සුදුසු ස්ථානවල ඔසු උයන් ස්ථාපිත කළ යුතුය.

- ප්‍රාදේශීය මට්ටමෙන් වගා කරන ඖෂධ පැළෑටි භාවිත කර ඖෂධ නිපදවීම ප්‍රවර්ධනය කළ යුතුය.

**1.2.2.3 ඌණ උපයෝජිත රෝහල් ගොඩනැගිලි හා අනෙකුත් පොදු ගොඩනැගිලි සම්ප්‍රදායික වෛද්‍ය සේවා සැපයීම සඳහා යොදා ගැනීම**

- දැනට පූර්ණ වශයෙන් භාවිතයට නොගැනෙන රෝහල් හා අනෙකුත් ගොඩනැගිලි දේශීය වෛද්‍ය සේවාවන් පවත්වාගෙන යාමට යොදාගත යුතු වේ.

**1.2.2.4 ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම**

- දැනට භාවිතයේ පවත්නා ආයුර්වේද රෝහල්, බෙහෙත් ශාලා, ඖෂධ ගබඩා වැනි ප්‍රාග්ධන වත්කම් කාලීනව නඩත්තු කළ යුතු වේ.

**1.2.2.5 දේශීය වෛද්‍ය සේවාවේ දියුණුවට අදාල අනෙකුත් වැඩසටහන්**

- ඉහතින් දක්වන ලද උප වැඩසටහන් යටතේ ඇතුළත් නොකරන ලද ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් මේ යටතේ ඉදිරිපත් කළ යුතුය.

**1.3 ක්‍රීඩා:**

- පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

- ශාරීරික ව්‍යායාම සඳහා ජනතාව පෙළඹවීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

- ලියාපදිංචි ක්‍රීඩා සමිතිවලට ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ලබාදීම තුළින් ප්‍රාදේශීය ක්‍රීඩකයින් දිරිගැන්වීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

- ක්‍රීඩා පිට්ටනි වැඩිදියුණු කිරීම හා නවීකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.4 **පරිවාස හා ළමාරක්ෂක:**

- පරිවාසභාරයේ සිටින ළමුන්ගේ දෛනික අවශ්‍යතා හා සුභසාධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

- සමාජයීය වශයෙන් අසාධාරණයට පත්වූ ළමුන් ආයතනගත කිරීම හරහා යහපත් පුරවැසියන් ලෙස යළිත් සමාජගත කරවීමට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

1.5 **සමාජ සේවා:**

- රෝගී බව, මහළු බව, ආබාධිත බව හෝ අනාථභාවය නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයන්ගේ සුභසාධනය තහවුරු කිරීම උදෙසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු වේ.
- වැඩිහිටි නිවාස හා ළමා නිවාස පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම සිදු කළ යුතු වේ.
- වැඩිහිටියන්, වැඩිහිටි නිවාසවලට යොමු කිරීම අවම වන පරිදි ඔවුන් රැකබලා ගැනීමේ වගකීම අදාල පවුල්වලට සහ ප්‍රජාවට පැවරෙන අයුරින් ක්‍රියාමාර්ග හා ක්‍රමවේද හඳුන්වා දීම සිදු කළ යුතු වේ.
- සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා සඳහා අවශ්‍ය වෘත්තීමය පුහුණුව ලබාදීම සිදු කළ යුතු වේ.

- රිදියගම නිවර්තන නිවාසය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන යොදවා නිවාසයේ රැඳවියන්ගේ නේවාසිකාගාර අලුත්වැඩියා කිරීම, පානීය ජල පහසුකම් ලබා දීම හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම සිදු කළ යුතු වේ.

1.6 **සංස්කෘතික හා ආගමික කටයුතු:**

- පළාත තුළ පවත්නා සංස්කෘතික දායාදයන් හා උරුමයන් සංරක්ෂණය කොට අනාගත පරපුර සඳහා දායාද කිරීමට උපකාරී වන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ.

- දහම් පාසල් අධ්‍යාපනය තුළින් දරුවන්ගේ සදාචාර වර්ධනය සඳහා ඉවහල් වන ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

1.7 **නිවාස:**

- අඩු ආදායම්ලාභී ඉතා දිළිඳු පවුල් සඳහා නිවාස අවශ්‍යතා සපුරාලී සිදු කළ යුතු වේ.
- ඉතා දිළිඳු පවුල් සඳහා ස්වයං උපකාරක ප්‍රවේශය යටතේ නිවාස තනාගැනීම සඳහා ප්‍රදාන සැපයීම සිදු කළ යුතු වේ.

- චක්‍රිය අරමුදල් පවත්වාගෙන යෑම වෙනුවට ප්‍රාදේශීය මට්ටමේ බැංකු පද්ධතිය සමග සම්බන්ධ වී අඩු ආදායම්ලාභී පවුල්වලට සහනදායී නිවාස ණය සැපයීම සිදු කළ යුතු වේ.

- නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය මගින් ලබාදෙන සහන වැඩපිළිවෙලවල් සමග ද්විකරණය නොවන අන්දමින් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

2 **ආර්ථික යටිතල පහසුකම්:**

2.1 **පළාත් මාර්ග (C හා D):**

2.1.1 **මාර්ග කාපට් කිරීම / වැඩිදියුණු කිරීම**

- ජාතික මාර්ග පද්ධතිය සමග සම්බන්ධතාවය මනාව තහවුරු කෙරෙන පරිදි C හා D මාර්ග කාපට් කිරීම සිදු කළ යුතු වේ.

- කාපට් නොකරන මාර්ග සඳහා තාර හෝ කොන්ක්‍රීට් දැමීම වැනි ස්ථිර ක්‍රියාමාර්ග ගත යුතු වේ.

**2.1.2 මාර්ග හා සම්බන්ධ යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම (කාණු හා බෝක්කු වැනි)**

- C හා D කාණ්ඩයේ මාර්ගවල ව්‍යුහාත්මක ඉදිකිරීම්වලට හානි නොවන පරිදි ගමනාගමන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙනයාම සඳහා පාලම්, බෝක්කු හා කාණුවැනි යටිතල පහසුකම් ඉදිකිරීමට කටයුතු කළ යුතුය.

- මෙම මාර්ගවල වාර්ෂික අලුත්වැඩියා හා නඩත්තු වියදම අවම කරනුවස් කාණු පද්ධති හා පැති බැම් වැනි යටිතල පහසුකම් වැඩිදියුණු කළ යුතුය.

**2.1.3 මාර්ග සංවර්ධනයට අයත් අනෙකුත් වැඩසටහන්**

- ඉහත උප වැඩසටහන් යටතේ ඇතුළත් කිරීමට නොහැකි වූ එහෙත් මාර්ගවල තත්ත්වය සහ මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන වෙනත් ක්‍රියාකාරකම් මේ යටතේ ඇතුළත් කළ යුතුය. මෙහිදී, සුදුසු ස්ථානවල පදිකයින්ට ගමන් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම (Sidewalk) වැනි කාර්යයන් කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

**2.2 වතු මාර්ග:**

- වතු මැදින් ගම්වලට ප්‍රවේශ වීම සඳහා තිබෙන මාර්ග පමණක් සංවර්ධනය කිරීම කළ යුතු අතර, වතුවලට ප්‍රවේශ වීම සඳහා ඇති මාර්ග සංවර්ධනය නොකළ යුතුය.
- අංක FC/PR&P/GL/2012 දරන මුදල් කොමිෂන් සභාවේ 2011.10.27 දිනැති මාර්ගෝපදේශයේ සඳහන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළයුතුවේ.

  - ගම්වලට ප්‍රවේශ වීම සඳහා වතු හරහා දිවෙන පළාත් සභා හා පළාත් පාලන මාර්ග පමණක් තෝරා ගත යුතු වේ.

  - එම තෝරා ගත් මාර්ගවල, වතු තුළ ඇති කොටස්වල අත්‍යාවශ්‍ය පිළිසකර කිරීම් පමණක් කළ යුතු වේ.

  - වැඩි දියුණු කරනු ලබන සෑම මාර්ගයකටම අදාල වතු සමාගම හෝ කුඩා තේ වතු සංවර්ධන සමිතියේ දායකත්වය ලබා ගත යුතුය.

  - පිළිසකර කරන මාර්ගවල බොරළු ඇතිරීම, කොන්ක්‍රීට් කිරීම හෝ තාර දැමීම නියමිත ප්‍රමිතීන්ට අනුකූලව සිදු කළ යුතු අතර, එම මාර්ගවල ස්වභාවය අනුව මෙම ක්‍රම තුනේම සංකලනයක් වුවද එකම මාර්ගයේ භාවිතා කළ හැකිය. තවද, අවශ්‍ය තැන්වල කුඩා පාලම්, බෝක්කු හෝ පැති බැම් ඉදි කිරීම සිදු කළ හැකි අතර, වාහන ධාවනය කළ හැකි වන සේ වාහනවල රෝද සලකුණු මාර්ග (wheel track) ඉදි කළ යුතුය.

  - වතු මාර්ග පිළිසකර කරන අවස්ථාවලදී, එම පිළිසකර කිරීම්වල ප්‍රමිතිය අධීක්ෂණය හා ප්‍රගතිය ඇගයීම සඳහා වතු සමාගම් හා කුඩා තේ වතු සංවර්ධන සමිතිවලට අවස්ථාව ලබා දිය යුතුය.

**2.3 ප්‍රවාහන:**

**2.3.1 සනීපාරක්ෂක පහසුකම් ඇතුළුව බස් අංගන නඩත්තු කිරීම**

- මගී ජනතාවට පහසුකම් සැපයෙන අයුරින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් නොවන බස් අංගන මැනවින් නඩත්තු කළ යුතුය.

- මෙම නඩත්තු කටයුතුවල දී සනීපාරක්ෂක පහසුකම් සැපයීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. ඒවා නඩත්තු කිරීමේ දී ගාස්තු අය කිරීමේ පදනමින් ක්‍රියාත්මක කිරීමටඅවශ්‍ය පියවර ගත යුතුය.

- බස් අංගන තුළ වෙළඳ ව්‍යාපාර සඳහා ගොඩනැගිලි ඉදිකිරීම පිණිස මෙම අරමුදල් භාවිත නොකළ යුතු අතර, ඒ සඳහා පෙර විකුණුම් ක්‍රමය යටතේ පෞද්ගලික අංශයේ සහභාගිත්වය ලබාගත යුතුය.

- පාරවල් දෙපස මගී ආවරණ ඉදිකිරීමේ දී හැකිතාක් දුරට පෞද්ගලික අංශයේ සහ වෙනත් සංවිධාන හා පුද්ගලයින්ගේ සහභාගිත්වය ලබාගත යුතුය.

- මෙම අරමුදල් භාවිතයටගෙනකාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම සිදු නොකළ යුතුය.

**2.3.2 රියදුරු සහ කොන්දොස්තර මහතුන් හා අදාල කාර්ය මණ්ඩලයේ සේවා සැපයීමට අදාල ගුණාත්මකභාවය ඉහළ නැංවීම**

- අදාල පුද්ගලයින් හා නිලධාරීන් විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අදාල පුහුණුවීම් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිගත් පුහුණු ආයතන මගින් ක්‍රියාත්මක කළ යුතු වේ.

**2.4 ඉඩම්:**

**2.4.1 ඉඩම් සංවර්ධනය, වැඩිදියුණු කිරීම හා සංරක්ෂණය**

- පාරිසරික සංරක්ෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ජල මූලාශ්‍ර සහ කඩොලාන රැකගැනීම සහ පාංශු සංරක්ෂණය කෙරෙහි සැලකිලිමත් විය යුතු වේ.

- වන ගහනය ඉහළ නැංවීම සඳහා රජය විසින් දියත් කර ඇති වැඩසටහන්වලට අනුගත වන පරිදි සංවිධානාත්මක මට්ටමෙන් රජයේ සුදුසු ඉඩම්වල රුක් රෝපණයට සහ ඒවා නඩත්තු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

**2.5 කෘෂිකර්මය:**

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වැඩසටහන් සැලසුම් කිරීමේ දී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති සහ උපායමාර්ගවලට අනුගත වන පරිදි පළාත් අධිකාරීන් විසින් කටයුතු කළ යුතුය.

**2.5.1 නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම (වී, අනෙකුත් ක්ෂේත්‍ර බෝග සහ බීජ වර්ග)**

- ඉහතින් සඳහන් කළ බෝග වර්ග නිෂ්පාදනයේ දී නව තාක්ෂණය යොදා ගැනීම තුළින් ඵලදායිතාවය ඉහළ නැංවීම සිදු කළ යුතු වේ.

- වගාවට නොගත් ඉඩම් ඵලදායී අයුරින් වගා කටයුතු සඳහා යෙදවීමට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

- කාබනික පොහොර භාවිතයට ගෙන සෞඛ්‍යයට හිතකර ආහාර බෝග නිෂ්පාදනය දිරිගැන්වීමට ක්‍රියා කළ යුතුය.

- ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. විශේෂයෙන් ලොකු ළූණු, අර්තාපල් සහ බෝංචි වැනි බෝගවලට අයත් බීජ නිෂ්පාදනය කෙරෙහි වැඩි අවධානය යොමු කළ යුතු වේ.

2.5.2 **කුඩා හා මධ්‍ය පරිමාණ වාණිජමය වගා කටයුතු පහසු කරලීම (පළතුරු, මල්, එළවළු හා බුලත් වැනි)**

- අපනයන වෙළඳපොළ මුල්කරගත් බෝග වර්ග වාණිජමය පදනමකින් වගා කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරිගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ.

- වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු වේ (අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර වැඩපිළිවෙලක් යෙදීම වඩා යෝග්‍ය වේ).

2.5.3 **කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත / අගය එකතු කරනු ලබන කර්මාන්ත දිරිගැන්වීම**

- කෘෂි අමුද්‍රව්‍ය භාවිතයට ගෙන එකතු කළ වටිනාකමක් සහිතව දේශීය හා විදේශීය වෙළඳපොළ කේන්ද්‍රකරගත් කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

- මෙහිදී, මූලික ප්‍රාග්ධනය, වෙළඳපොළ හා තාක්ෂණය යනාදිය අදාල කර්මාන්තකරුවන්ට ලබාදීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

2.5.4 **පුරන් කුඹුරුවල විකල්ප බෝග වගා කිරීම දිරිගැන්වීම (අල වර්ග, ඉඟුරු, ධාන්‍ය සහ පළා වර්ග)**

- පුරන් කුඹුරු යළි අස්වැද්දීම වෙනුවට ඒවා වඩා ඵලදායී කාර්යයකට යොදාගත හැකි වන පරිදි විකල්ප බෝග වගාවට ගොවීන් යොමු කළ යුතු වේ.

- එක් එක් පළාතේ පවත්නා විභවතාවයන් සැලකිල්ලට ගෙන අදාල බෝග වර්ග තෝරා ගත යුතු වේ.

2.5.5 **කෘෂි මාර්ග ඉදිකිරීම හා නඩත්තු කිරීම**

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්ණායක සකස් කිරීමෙන් අනතුරුව, සංවර්ධනය කළ යුතු කෘෂි මාර්ග හඳුනා ගැනීම සිදු කළ යුතු වේ. එම නිර්ණායක මගින් දුෂ්කර මාර්ග හේතුවෙන් පීඩාවට පත්ව ඇති ඵලදායී කෘෂි ප්‍රදේශයන් ආවරණය වීම අත්‍යාවශ්‍ය වේ.

- පොදුවේ කෘෂි මාර්ග විශාල ප්‍රමාණයක් තෝරා ගැනීම වෙනුවට, වර්ෂයක දී මාර්ග කිහිපයක් පමණක් තෝරා ගෙන සංවර්ධනය කළ යුතු වේ.

- මෙවැනි මාර්ග සංවර්ධනයේ දී අවධානය යොමු කළ යුත්තේ අවශ්‍ය ස්ථානවල බෝක්කු බැඳීම, කොන්ක්‍රීට් දැමීම වැනි මූලික ඉදි කිරීම් සඳහා වන අතර, බොරලු ඇතිරීම වැනි තාවකාලික කාර්යයන්වලට අරමුදල් නොයෙදවිය යුතුය.

- කෘෂි මාර්ග සංවර්ධනය කිරීමේදී පළාත් මාර්ග දෙපාර්තමේන්තුවේ/ අධිකාරියේ හෝ පළාතේ වෙනත් පිළිගත් ඉංජිනේරු ශිල්පීය ආයතනයක සේවය ලබා ගත යුතු වේ.

2.5.6 **පළාත් කෘෂිකාර්මික ගොවිපළවල් හා කෘෂි පුහුණු මධ්‍යස්ථාන නවීකරණය කිරීම**

- පළාත් සභා සතු ගොවිපළවල් හා පුහුණු මධ්‍යස්ථාන නවීකරණය තුළින් ඒවායින් සැපයෙන සේවාවන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කළ යුතු වේ.

- පළාත්වලට අයත් ගොවිපළවල්වල නිපදවෙන ආහාර ද්‍රව්‍ය, බීජ, රෝපණ ද්‍රව්‍ය සහ අනෙකුත් නිෂ්පාදන ජනතාවට සහන මිලකට සැපයීමටත්, උසස් වර්ගයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය මෙන්ම නවීන තාක්ෂණය ගොවිජනතාවට ලබාදීමටත් ක්‍රියා කළ යුතුය.

2.5.7 **කෘෂිකර්ම සංවර්ධනයට අදාල අනෙකුත් වැඩසටහන්**

- ඉහතින් දක්වන ලද උපවැඩසටහන්වලින් ආවරණය නොවන වැඩසටහන් මේ යටතේ ඇතුළත් කළ හැකි වේ.

**2.6 පශු සම්පත්:**

පශු සම්පත් ක්ෂේත්‍රයේ (මස්, කිරි හා බිත්තර නිෂ්පාදන) වැඩසටහන් සැලසුම් කිරීමේ දී පශු සම්පත් සංවර්ධන විෂයට අදාල රේඛීය අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති සහ උපායමාර්ගවලට අනුගත වන පරිදි පළාත් අධිකාරීන් විසින් කටයුතු කළ යුතුය.

**2.6.1 කාර්යක්ෂම පශු වෛද්‍ය සේවාවක් සහතික කරලීම**

- පශු ගොවීන් සඳහා අවශ්‍ය කරනු ලබන පශු වෛද්‍ය සේවාවන් කාර්යක්ෂමව සැපයීම තුළින් පශු ක්ෂේත්‍රයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට මෙම අරමුදල් යොදාගත යුතු වේ.

**2.6.2 කුඩා හා මධ්‍යම පරිමාණයේ වාණිජමය සත්ත්ව ගොවිපළවල් සඳහා පහසුකම් සැපයීම**

- පළාත් මට්ටමේ පශු ගොවිපළවල් වාණිජමය ශක්‍යතාවයකින් යුතුව පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ.

- කුඩා හා මධ්‍ය පරිමාණ පෞද්ගලික සත්ත්ව ගොවිපළවල් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

**2.6.3 එකතු කළ වටිනාකම් සහිත කර්මාන්ත දිරිගැන්වීම**

- පශු නිෂ්පාදන පදනම් කරගත් එකතු කළ අගය සහිත කර්මාන්ත ඇරඹීමෙහිලා පෞද්ගලික අංශය නැඹුරු කරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු වේ.

**2.6.4 කෘතිම සිංචනය මගින් දෙමුහුන් සතුන් බෝ කිරීම හා ප්‍රවර්ධනය කිරීම**

- කෘතිම සිංචන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම මගින් වැඩි ඵලදාවක් සහිත සත්ත්ව ගහනයක් ඇති කිරීම පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා අදාල වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

**2.6.5 කිරි එකතු කිරීමේ හා ගබඩා කිරීමේ පහසුකම් සපයා දීම**

- කිරි ගොවියා හා පෞද්ගලික ගැනුම්කරුවා අතර මනා සම්බන්ධීකරණයක් ඇති වන පරිදි එකතු කිරීමේ මධ්‍යස්ථාන හා ගබඩා පහසුකම් සැපයීම කළ යුතු වේ.

- දැනට තිබෙන කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන හා ගබඩා මනාව නවීකරණය හා නඩත්තුව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ.

**2.6.6 පශු සම්පත් අංශයට අදාල අනෙකුත් වැඩසටහන්**

- ඉහතින් දක්වන ලද වැඩසටහන්වලින් ආවරණය නොවන වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කළ හැකිය.

**2.7 සංචාරක කර්මාන්තය:**

**2.7.1 සංචාරක ආකර්ශනයක් සහිත ස්ථාන වැඩිදියුණු කිරීම**

- සංචාරක ආකර්ශනය සහිත ස්ථානවල මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කළ යුතු අතර, පෞද්ගලික අංශයේ දායකත්වය ද මෙහිදී ලබා ගත යුතු වේ.

**2.7.2 සංචාරකයින්ට මූලික සේවා පහසුකම් සපයනු ලබන ඒකාබද්ධ මධ්‍යස්ථාන පිහිටුවීම (පෞද්ගලික අංශයේ කළමනාකරණය යටතේ)**

- සංචාරක ආකර්ශනය සහිත ස්ථානවල මූලික සේවා පහසුකම් සැපයීම සිදු කළ යුතු අතර, ඒවායේ කළමනාකරණය පෞද්ගලික අංශයට භාරදිය යුතු වේ (කුඩා ආපන ශාලා, සනීපාරක්ෂක පහසුකම්, මුහුද ආශ්‍රිත ස්ථානවල නැවුම් ජල (Fresh water) ස්නාන පහසුකම් ආදිය).

**2.7.3 සංචාරක ස්ථාන පිළිබඳ තොරතුරු සැපයීම හා අදාල සේවා නියුක්තිකයින්ගේ ධාරිතා සංවර්ධනය**

- එක් එක් පළාතට ආවේණික වූ සංචාරක ස්ථාන පිලිබඳව දේශීය හා විදේශීය සංචාරකයින් දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතු වේ (මේවා පාරිසරික, ත්‍රාසජනක, කෘෂි, සංස්කෘතික ආදී වශයෙන් වර්ගීකරණය කළ හැකිය).

**2.8 මිරිදිය ධීවර:**

- ග්‍රාමීය ජනතාව අතර මත්ස්‍ය නිෂ්පාදන සුලභ කළ යුතු අතර, එමඟින් ග්‍රාමීය ජනතාවගේ පෝෂණ ඌණතාවයන් අවම කිරීමට කටයුතු කළ යුතු වේ.
- මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම, අලෙවිකරණ පහසුකම් වැඩිදියුණු කිරීම, වෙළඳපොළ සම්බන්ධීකරණ කටයුතු වඩා පුළුල් කිරීම හා විසිතුරු මසුන් ඇති කිරීම ප්‍රවර්ධනය සිදු කළ යුතු වේ.
- ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යමින් අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගැනීමට පියවර ගත යුතු වේ.
- ධීවර සමිති විධිමත්ව සංවිධානය කිරීම හා කළමනාකරණය ක්‍රමවත් කළ යුතු වේ.
- මත්ස්‍ය ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය.
- ධීවර ප්‍රජාවට අවශ්‍ය ආම්පන්න හා උපකරණ සැපයීම මගින් ඔවුනට පහසුකම් සැපයිය යුතු වේ.

**2.9 වාරිමාර්ග:**

- වගා බිම්වලට අවශ්‍ය වාරි ජල සැපයුම තහවුරු කළ යුතු අතර, වගා බිම් දක්වා ජලය ගෙන යාමට අවශ්‍ය සෑම කාර්යයක් කෙරෙහිම අවධානය යොමු කළ යුතු වේ.
- පවතින වාරිමාර්ග ක්‍රම නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම, සුළු වාරිමාර්ග ව්‍යුහයන් (Minor structures) ඉදිකිරීම, විධිමත් ජල කළමනාකරණ ක්‍රම කෙරෙහි අවධානය යොමු කිරීම හා එම කටයුතු සඳහා ගොවි සංවිධානවල සහභාගිත්වය සහ දායකත්වය උපරිමයෙන් ලබාගැනීමට කටයුතු කිරීම සඳහා අවධානය යොමු කළ යුතු වේ.
- ප්‍රශස්ත ජල කළමනාකරණය මගින් වී වගාවට අමතරව අතුරු බෝග සඳහා ද වාරි ජලය ලබා දීමට කටයුතු කළ යුතුය.
- සුළු වාරි මාර්ග සංවර්ධනය සඳහා ගොවි සංවිධානවල ද්‍රව්‍යමය හා ශ්‍රම දායතක්වය ලබාගත යුතු අතර, පිරිවැය ඇස්තමේන්තුවලට එම දායකත්වය ඇතුළත් කළ යුතු වේ.

**2.10 ග්‍රාම සංවර්ධනය:**

- ගම් ආශ්‍රිත කුඩා පාරවල්,කුඩා පාලම් හා බෝක්කු, ග්‍රාමීය වෙළඳපොළ පහසුකම්, සුසාන භූමි, පුස්තකාල හා ප්‍රජා පානීය ජල සැපයීම වැනි සුළු පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය.
- මෙවැනි කුඩා ව්‍යාපෘතිවල ප්‍රමිතිය සහතික කරලීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ මාර්ග සංවර්ධන අධිකාරිය වැනි ජාතික හා පළාත් මට්ටමේ ආයතන හා පළාත් පාලන ආයතන සමග සම්බන්ධතාවය පවත්වාගත යුතු වේ.
- ගම් මට්ටමේ ඇති ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන, සිවිල් සංවිධාන සහ ආගමික නායකයින් මෙම කටයුතුවලට සම්බන්ධ කර ගැනිම අවශ්‍ය වේ.

- පළාත් පාලන ආයතන මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සමග ද්විකරණය නොවන පරිදි කටයුතු කිරීම අවශ්‍ය වේ.

**2.11 කුඩා කර්මාන්ත:**

- කුඩා හා ලුහු කර්මාන්ත සහ පේෂ කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා සම්ප්‍රදායික නිෂ්පාදන දිරිගැන්වීම, ඒවායේ ගුණාත්මකභාවය තහවුරු කිරීම, වෙළඳපොළ සම්බන්ධීකරණය සහ නව තාක්ෂණය හඳුන්වා දීම කළ යුතු වේ.

- මෙහිදී, වාණිජ මණ්ඩල, මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රාදේශීය බැංකු සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගත යුතු වේ.

- කුඩා කර්මාන්ත නිෂ්පාදන අලෙවි කිරීමේදී රාජ්‍ය අංශය විසින් පවත්වාගෙන යනු ලබන ආයතන එතරම් ඵලදායි නොවන බව නිරීක්ෂණය වී ඇති බැවින්, එවැනි අලෙවි කටයුතු කළමනාකරණය කිරීම පෞද්ගලික අංශය මගින් කරවාගත යුතුය.

- මෙහිදී පිළිගත් පෞද්ගලික අංශයේ ආයතන අතරින් විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් තුළින් තෝරාගත් ආයතන සමග අවබෝධතා ගිවිසුම් ඇතිකරගෙන අලෙවි ප්‍රවර්ධනයට අදාල වගකීම එම ආයතනවලට භාර දීමටත්, නිෂ්පාදන සඳහා එකඟ වූ මිල පළාත් ආයතනයට ලබාගැනීමටත් වගබලා ගත යුතුය.

- මෙවැනි වැඩපිළිවෙලවල් සමග අලෙවි මධ්‍යස්ථානවල කාර්යමණ්ඩලසුදුසු පරිදි ස්ථානගත කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

- කුඩා කර්මාන්ත හා පේෂ කර්මාන්ත නිෂ්පාදනවල අලෙවි ආදායම සුදුසු පරිදි එම කර්මාන්තයන්හි සංවර්ධනය සඳහා යෙදවීමට අවශ්‍ය වැඩපිළිවෙලවල් යෙදිය යුතුය.
- කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් අවසානයේ ලබා දෙන සහතික, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුවට ගැලපෙන පරිදි විය යුතුය.
- මෙවැනි පුහුණුව ලැබූ අය සුදුසු රැකියා සඳහා යොමු කිරීමට මග පෙන්වීම සිදු කළ යුතු වේ.

**2.12 ග්‍රාමීය විදුලිබල සැපයුම:**

- ජාතික විදුලිබල පද්ධතියෙන් ග්‍රාමීය ප්‍රදේශවලට විදුලි දිගු ලබා දීම හෝ ඉදිරි වර්ෂ තුන තුළදී ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලිය සැපයීමට අපොහොසත් ප්‍රදේශවලට ශක්‍යතාවයෙන් යුත් විකල්ප විදුලි ජනනයන් ලබා දීම සිදු කළ යුතු වේ.

- ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලි දිගු ලබා දීමේදී තනි නිවාස සඳහා විදුලි රැහැන් ඇදීම සිදු නොකළ යුතු අතර, පොදු විදුලි දිගු සඳහා පමණක් ප්‍රතිපාදන යෙදවිය යුතුය.
- සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග සම්බන්ධීකරණය කිරීමෙන් විකල්ප බලශක්ති ප්‍රභවයන් සැපයිමට හා විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

**2.13 තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වූ ඒකාබද්ධ ව්‍යාපෘති:**

- පළාත් තුළ හා පළාත් අතර පවත්නා සමාජ-ආර්ථික විෂමතාවයන් අවම කරලීමට තුඩුදෙන අයුරින් කිසියම් බලපෑමක් ඇති කළ හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ.

- දැනටමත් ආරම්භ කර ඇති ව්‍යාපෘති නිම කිරීම සඳහා ප්‍රමුඛතාවය දිය යුතුය.

- එකතු කළ වටිනාකම ඉහළ නැංවීම, රැකියා උත්පාදනය සහ දිළිඳුබව අඩුකරලීම යන අරමුණු මුල්කොට ගනිමින් මෙම ව්‍යාපෘති සකස් කළ යුතු වේ.

**2.14 ඌණ සේවා ගම්මානවල පහසුකම් වැඩිදියුණු කිරීම:**

- සමාජ හා ආර්ථික යටිතල පහසුකම් අවම වීමහෝවිවිධ පාරිසරික හා සමාජයීය තත්ත්වයන් මත පසුගාමී තත්ත්වයට පත්ව ඇති ගම්මානවල මූලික පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

- එම ගම්මාන සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය සියලු කරුණු කෙරෙහි මනා අවධානයක් යොමු කර, හඳුනාගනු ලබන ගැටළු සඳහා ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයක් ක්‍රියාත්මක කළ යුතු වේ.

- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට අයත් ගම්මාන පමණක් තෝරා ගත යුතු වේ. මේ සඳහා ආදායම් මූලාශ්‍ර හිඟය සහ පොදු පහසුකම් ඌනතාවය වැනි නිර්ණායක භාවිත කළ යුතුය.

- ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රජා සහභාගිත්වය ලබා ගත යුතු අතර,ග්‍රාමීය මට්ටමේ රජයේ නිලධාරීන්, ප්‍රජා සංවිධාන නියෝජිතයින්, ආගමික නායකයින් හා ප්‍රාදේශීය සභා මහජන නියෝජිතයින්ගෙන් සමන්විත ග්‍රාමීය මට්ටමේ කමිටුවක් පිහිටුවිය යුතු වේ.

- එක් එක් ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාව තුළ පවතින ආයතනවල සහයෝගය ලබාගත යුතු අතර, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම, අධීක්ෂණ හා නියාමන කාර්යය පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව/ ඒකකය විසින් සිදු කළ යුතුය.

**3 පළාත් පාලන හා ප්‍රජා සේවා:**

**3.1 පළාත් පාලන:**

**3.1.1 පළාත් පාලන මාර්ග:**

- පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග පද්ධති මනාව පවත්වාගෙන යාම හා නඩත්තු කිරීමසිදු කළ යුතු වේ.
- පළාත් පාලන මාර්ග පද්ධතීන් ස්ථිර පදනමකින් පවත්වාගැනීම සඳහා කොටස් වශයෙන් හෝ කොන්ක්‍රීට්/තාර ඇතිරීම සිදු කළ යුතුය.

- වැඩිදියුණු කළ යුතු පළාත් පාලන මාර්ග විධිමත් ක්‍රමවේදයකින් තෝරාගත යුතු අතර, මෙම මාර්ග සංවර්ධනය කිරීමේ වගකීම අදාල පළාත් පාලන ආයතන විසින්ම දැරිය යුතුය. එම කටයුතු පළාත් පාලන කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතුය.

**3.1.2 ප්‍රජා ජල සැපයීම:**

- පානීය හා සනීපාරක්ෂක කටයුතු සඳහා ජල පහසුකම් ලබා දීම සිදු කළ යුතු අතර,පානීය ජලය සැපයීමේ දී ජලයේ ගුණාත්මකභාවය ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් තහවුරු කරගත යුතුය.

- පොදු ළිං හා නාන තටාක සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම සිදු කළ යුතු වේ.

**3.1.3 අපද්‍රව්‍යකළමනාකරණය:**

- බෝවන රෝගවලට ප්‍රධාන වශයෙන් හේතුකාරක වන කැළිකසල බැහැර කිරීම ක්‍රමවත්ව කළමනාකරණය කළ යුතු අතර, තම බල ප්‍රදේශය තුළ සෞඛ්‍යයට හිතකර පරිසරයක් පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

- අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, කොම්පෝස්ට් පොහොර නිපදවීම, නොදිරන ද්‍රව්‍ය කළමනාකරණය තුළින් අපද්‍රව්‍යවලට ආර්ථික වටිනාකමක් ලබා දීම වැනි කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය දිය යුතු වේ.

- කසල ජනනය කරනු ලබන ස්ථානයන්හිදී ම එම කසල වර්ගීකරණය කිරීමට මහජනතාව යොමු කරවීම කළ යුතු වේ.

**3.1.4 අනෙකුත් පළාත් පාලන සේවා:**

- ඉහතපළාත්පාලන විෂයය යටතේ ආවරණයනොවූවෙනත් සංවර්ධන ක්‍රියාකාරකම් මේ යටතට ඇතුළත් කළ හැකිය.

**3.1.5 මහනගර සභාවල ධාරිතා වර්ධනය:**

- මහ නගර සභා බැඳුම්කර, භූගෝලීය තොරතුරු පද්ධති (GIS) තාක්ෂණය පරිහරණය කරමින් දේපළ තක්සේරු කිරීම සහ බදු මුදල් ගෙවීමේදී ප්‍රධාන කාර්යාල වෙත නොගොස් අන්තර්ජාල භාවිතයෙන් ගෙවීම් කිරීම හා මහජන පැමිණිලි අප්‍රමාදව සලකා බලා විසඳුම් ලබා දීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.මෙහිදී, 2015 වර්ෂයේ සැලැස්මට ඇතුළත් නොකළ මහ නගර සභා තෝරාගත යුතු වේ.

**3.2 සමුපකාර:**

- සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

- සමිති කාර්යමණ්ඩල හා සාමාජිකයින් සඳහා අත්‍යවශ්‍ය පුහුණුවීම් ලබා දීම සිදු කළ යුතු වේ.

- සමුපකාර ක්ෂේත්‍රය මනාව නියාමනය කිරීම සිදු කළ යුතු වේ.

- වාණිජ කාර්යයන්වල යෙදී සිටින සමුපකාර සමිති සඳහා සෘජු ප්‍රදාන හෝ අනෙකුත් සම්පත් මෙම ප්‍රතිපාදනවලින් ලබා නොදිය යුතුය.

**4 නම්‍යශීලී ප්‍රතිපාදන:**

- එක් එක් අංශ/ ආයතන සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනයේ ඌණතාවයන් ගලපා ගැනීමට හෝ අනුමත සැලැස්මට ඇතුළත් නොවූ අත්‍යාවශ්‍ය කටයුතු සඳහා යෙදවීමට මෙම ප්‍රතිපාදන භාවිත කළ යුතු වේ.

- නම්‍යශීලී ප්‍රතිපාදන යටතේ සකස් කරනු ලබන සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

ඉහත දැක්වූ කරුණු සැලකිල්ලට ගෙන 2016 වර්ෂය සඳහා වූ සංවර්ධන සැලැස්ම මේ සමග අමුණා ඇති ආකෘති පත්‍ර 3, 3-a හා 4 අනුව සකස් කර, 2016 පෙබරවාරි 29 දිනට පෙර මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි. එසේම, එම සැලසුම් සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගත් පසු භාණ්ඩාගාර ලේකම්ගේ 2015.07.29 දිනැති අංක 3/2015 දරන අයවැය චක්‍රලේඛය මගින් ශුන්‍ය පාදක අයවැය ක්‍රමවේදය යටතේ හඳුන්වාදෙන ලද ආකෘති පත්‍රය (Table 1) අනුව 2016 සංවර්ධන සැලැස්ම නැවත සකස් කර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බව කාරුණිකව දන්වමි. එම ආකෘති පත්‍රය පදනම් කරගෙන අඛණ්ඩ වැඩ සඳහා ද ආකෘති පත්‍රයක් (Table 2) සකස් කරන ලද අතර, එයට අනුව අඛණ්ඩ වැඩ ඉදිරිපත් කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

ආයතනික ප්‍රතිඵල රාමු සකස් කිරීමේ ක්‍රියාවලියේ දී ඔබ වෙත ලබා දී ඇති ආකෘති පත්‍ර 5 හා 6 පිළිබඳව ද ඔබගේ අවධානය යොමු කරන අතර, ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක මට්ටමෙන් ප්‍රතිඵල සමාලෝචනය උදෙසා එම ආකෘති පත්‍ර භාවිතා කරමින් නිශ්චිත කාල වකවානුවලදී මුදල් කොමිෂන් සභාව වෙත ප්‍රගතිය වාර්තා කරන මෙන් කාරුණිකව දන්වමි.

මෙම මාර්ගෝපදේශයන්හි පිටපත් පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හා වෙනත් අදාල පාර්ශවයන් වෙත ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. මෙම මාර්ගෝපදේශ මුදල් කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් ද (www.fincom.gov.lk) ලබාගත හැකිය.

මෙම මාර්ගෝපදේශයේ දෙමළ සහ ඉංග්‍රීසි පිටපත් වෙනම නිකුත් කරනු ලැබේ.



ඩබ්.එච්.මුණසිංහ

ලේකම්

මුදල් කොමිෂන් සභාව

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කා.දැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය - කැ.දැ.ස.
3. ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - කැ.දැ.ස.
4. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ස.
5. ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කා.දැ.ස.
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
7. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මහා භාණ්ඩාගාරය - කා.දැ.ස.
8. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
9. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
10. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) - අ.ක.ස.
11. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - අ.ක.ස.
12. සහකාර විගණකාධිපති - අ.ක.ස.